# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.20 පැය 0605 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1868 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

## 01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකල සැකකරුවන් දෙදෙනෙකු ගිනි අවිය සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය.

2024.12.14 වන දින මීගොඩ පොලිස් වසමේ නාගහවත්ත ප්‍රදේශයේදී කාර් රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධව මීගොඩ පොලිසිය හා බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපරාධයට සම්බන්ධ වෙඩික්කරු වශයෙන් කටයුතු කල සැකකරුවෙකු 2024.12.19 වන දින උදෑසන කාලයේදී මීගොඩ පොලිස් වසමේ පුවක්වත්ත මාර්ගයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 380 ක් සමඟින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම අපරාධයට ආධාර අනුබල දීම, සම්බන්ධයෙන් තවත් සැකකරුවෙකු 2024.12.19 වන දින සවස් කාලයේදී මීගොඩ පොලිස් වසමේ කුරුඳුවත්ත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 29 ක් වන පාදුක්ක හා මීගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී වෙඩික්කරු ලෙස ක්‍රියාකල සැකකරු යුධ හමුදාවේ සිට සේවය අතහැර ගිය පුද්ගලයෙකු වන අතර අපරාධයට යොදාගත් ටී.56 ගිනි අවිය, එම ජීව පතොරම් 26 ක් හා පතොරම් ගැබක් වළ දමා තිබියදී පොලිස් භාරයට ගෙන ඇත. අපරාධය සඳහා යොදාගත් බවට සැකකරන ත්‍රීරෝද රථයද පොලිස් භාරයට ගෙන ඇත.

මෙම අපරාධය සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ මීට වසරකට පමණ පෙර මංගල සාදයකදී මරණකරු තවත් අයෙකු සමඟ ඇතිවූ ආරවුලකට පලිගැනීමක් වශයෙන් මෙම අපරාධය සිදුකර ඇති බවයි.

බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය හා මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. වෙඩි තබා බරපතල තුවාල සිදුකිරීමකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය

2024.12.14 වන දින මරදාන පොලිස් වසමේ මාලිගාකන්ද උසාවි සංකීර්ණය අසලදී පුද්ගලයෙකුට වෙඩි තබා බරපතල තුවල සිදුකිරීමේ අපරාධය සම්බන්ධයෙන් මරදාන පොලිසිය හා කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.12.19 වන දින කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම අපරාධයට අවශ්‍යකර සිටි සැකකරුවන් දෙදෙනෙකු මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට තැත් කිරීම හා එයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 24 වයස්වල පසුවන කොළඹ 10 හා කොළඹ 14 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී අපරාධය සඳහා යොදාගත් බවට සැකකරන යතුරු පැදිය පොලිස් භාරයට ගෙන ඇත. මරදාන පොලිසිය හා කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දිය අනතුරකින් විදේශීය ජාතිකයින් දෙදෙනෙකු බේරා ගැනීම - හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2024.12.18 වන දින උදෑසන කාලයේ හික්කඩුව පොලිස් වසමේ හික්කඩුව නාරිගම සංචාරක මුහුදු තීරයේ දිය නාමින් සිටි විදෙස් ජාතික පිරිමි පුද්ගලයෙකු හා කාන්තාවක් දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් විසින් බේරා ගෙන ප්‍රථමාධාර ලබා දී පිටත් කර හැර ඇත.

**දිය අනතුරින් මුදාගත් පිරිමි පුද්ගලයා වයස අවුරුදු 27 ක හා කාන්තාව වයස අවුරුදු 18 ක වයස් වල පසුවන රුසියානු යුවලකි.**

හික්කඩුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනු ලබන පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ උප පොලිස් පරීක්ෂක දේශප්‍රිය, පොලිස් කොස්තාපල් 40785 චාමර හා පොලිස් කොස්තාපල් 94998 හේමකුමාර යන නිලධාරීන් විසින් මෙම දිවි බේරා ගැනීම සිදුකර ඇත.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.12.19 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ වෙරළුගහවත්ත ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන නාරම්මිනිය, කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2024.12.19 වන දින සවස් කාලයේ මොරටුව පොලිස් වසමේ රාවතාවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 520 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.19 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට හා කටුකුරුඳුවත්ත ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් තුනක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 660 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු, **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු හා **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 350 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 29 වයස්වල පසුවන ගල්කිස්ස හා බොරලැස්ගමුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරොන්තුඩුව පොලිස් ස්ථානය.**

2024.12.19 වන දින උදෑසන කාලයේ මොරොන්තුඩුව පොලිස් වසමේ කලපුගම ප්‍රදේශයේදී මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1080 මිලි ලීටර් 500 (බැරල් 06)** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන මොරොන්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරොන්තුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගණේමුල්ල පොලිස් ස්ථානය.**

2024.12.19 වන දින රාත්‍රී කාලයේ ගණේමුල්ල පොලිස් වසමේ පරකන්දෙණිය ප්‍රදේශයේදී ගණේමුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 202 මිලි ලීටර් 500 (බෝතල් 270) ක්** මෝටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු මෝටර් රථය සමඟින් අත්අඩංගුවට ගෙන කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන බටුවත්ත, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගණේමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.

2024.12.19 වන දින රාත්‍රී කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ බුලත්සංහල ඔරලෝසු කණුව අසලදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 89 මිලි ලීටර් 250 (බෝතල් 119) ක්** ත්‍රීරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. දියේ ගිලී අතුරුදහන්වීමක් - කොබෙයිගනේ පොලිස් වසම.

2024.12.19 වන දින උදෑසන කාලයේ කොබෙයිගනේ පොලිස් වසමේ දැදුරු ඔයේ දිය නාමින් සිටි දරුවන් දෙදෙනෙකු සැඩ පහරකට හසුවී එක් දරුවෙකු සැඩ පහරින් මිදී ගොඩට පැමිණ ඇති අතර අනෙක් දරුවා දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට බවට කොබෙයිගනේ පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ දරුවා වයස අවුරුදු 14 ක් වන හෙංගමුව, කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ දරුවා ඇතුළු දරුවන් පිරිසක් උපන්දින සාදයක් සමරා දැදුරු ඔය නැරඹීමට ගොස් ඉන් අතුරුදහන් වූ දරුවා සමග තවත් දරුවෙකු දියනෑමට ඔයට බැසීමෙන් මෙම අනතුරට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අතුරුදහන් වූ දරුවා සොයා කොබෙයිගනේ පොලිස් ස්ථානයේ නිලධාරීන්, නිකවැරටිය කොට්ඨාස ජීවිත ආරක්ෂක නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව තවදුරටත් මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. කොබෙයිගනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. සැකකටයුතු මරණයක් - මිනුවන්ගොඩ පොලිස් වසම.

2024.12.19 වන දින සවස් කාලයේදී මීනුවන්ගොඩ පොලිස් වසමේ කටුවැල්ලේගම ප්‍රදේශයේ නිවසක් තුළ සැක කටයුතු ලෙස බිම ඇද වැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට මීනුවන්ගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ කටුවැල්ලේගම, මීනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණය නිවස තුළ බිම ඇද වැටී මුවින් ලේ වැගිරී තිබූ අතර නිවසේ සියළු දොර ජනේල් විවෘත කර දේපල ඇද දමා ඇති බවට සිදුකරන ලද විමර්ශණයේදී අනාවරණය වී ඇත. මීනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. ගණිකා නිවාසක් වටලා සැකකාරියන් සිව් දෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් වසම.

2024.12.19 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ මැලිබන් හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසයක් වටලා ගණිකා නිවාස කළමනාකරණය කිරීම සම්බන්ධව සැකකාරියක් සහ ගණිකා වෘත්තියේ යෙදීම සම්බන්ධව සැකකාරියන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවුරුදු 36 ත් 49 ත් අතර වයස්වල පසුවන පරකඩුව, බලංගොඩ, කටුගස්තොට හා මල්වාන යන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. බඹර ප්‍රහාරයක් - දිඹුලපතන පොලිස් වසම.

2024.12.19 වන දින උදෑසන කාලයේදී දිඹුලපතන පොලිස් වසමේ ක්‍රිස්ලස්ෆාම් වත්ත ප්‍රදේශයේදී තේ දළු නෙලමින් සිටි කාන්තාවන් 05 දෙනෙකු බඹර ප්‍රහාරයකට ලක්ව කොටගල රෝහලට ඇතුලත් කර ඇති බවට දිඹුලපතන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකාරියන් අවුරුදු 34 ත් 54 ත් අතර වයස්වල පසුවන ක්‍රිස්ලස්ෆාම් වත්ත, කොටගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තුවාලකාරියන්ගෙන් එක් කාන්තාවක් පමණක් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර අනෙක් කාන්තාවන් සිව් දෙනා ප්‍රතිකාර ලබා රෝහලෙන් පිටව ගොස් ඇත. දිඹුලපතන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරවැව පොලිස් ස්ථානය.

2024.12.19 වන දින දහවල් කාලයේ මොරවැව පොලිස් වසමේ මහදිවුල්වැව ප්‍රදේශයේදී මොරවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන මහදිවුල්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මංගලගම පොලිස් ස්ථානය.

2024.12.19 වන දින සවස් කාලයේ මංගලගම පොලිස් වසමේ මංගලඔය ප්‍රදේශයේදී මංගලගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන වේලාම්වේනෙ, මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පලෙයි පොලිස් ස්ථානය.

2024.12.19 වන දින උදෑසන කාලයේ පලෙයි පොලිස් වසමේ කිලාලි ප්‍රදේශයේදී පලෙයි පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන එළුදුමට්ටුවාල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පලෙයි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - වීරවිල පොලිස් වසම.

2024.12.19 වන දින උදෑසන කාලයේ වීරවිල පොලිස් වසමේ මාතර වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ වීරවිල වැව ආසන්නයේදී මාතර දෙස සිට වැල්ලවාය දෙසට ධාවනය වූ බස් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් දෙසට ගමන් කළ පාපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු තිස්සමහරාම රෝහලට ඇතුලත් කිරීමේදී පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 85 ක් වූ වීරවිල වත්ත, වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තිස්සමහරාම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වීරවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**